# කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2014 වසරේ නිර්දේශ කරන ලද නව බෝග ප්‍රභේද

## වී ප්‍රභේද



### Bg 251

බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් ප්‍රථම වරට නිර්දේශ කරන ලද නියඟයට ඔරොත්තු දෙන වී ප්‍රභේදයයි. මාස 2 $^1/_2$ ක් වන මෙම ප්‍රභේදය නියඟයට පාත්‍ර වන ප්‍රදේශ සහ වර්ෂාපෝෂිත ප්‍රදේශ සඳහා නිර්දේශ කරන ලදී. ජල සම්පාදිත තත්ත්ව යටතේ හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 5.5 ක සාමාන්‍ය අස්වැන්නක් සහ වර්ෂාපෝෂිත තත්ත්ව යටතේ හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 3.6 ක සාමාන්‍ය අස්වැන්නක් ලබා ගත හැකිය. සුදු නාඩු සහලකි.

### Bg 310



බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් නිර්දේශ කරන ලද ලවණතාවයට ඔරොත්තු දෙන මාස 03 වයස් කාණ්ඩයේ වී ප්‍රභේදයකි. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 6 ක් වන අතර සුදු නාඩු සහලකි. ඇඳවැටීමට සහ කොළ පාළු රෝගයට ඔරොත්තු දෙයි.

### At 373 (අම්බලන්තොට සුවඳ සම්බා)



අම්බලන්තොට වී පර්යේෂණ මධ්‍යස්ථානය මගින් නිර්දේශ කරන ලද සුදුරු සම්බා වලට සමාන ලක්‍ෂණ සහිත මාස 3 $^{1}/_{2}$ වී ප්‍රභේදයකි. වී කෙටීමේදී කැඩෙන ප්‍රතිශතය ඉතා අඩු අතර පිසීමේදී ප්‍රසන්න සුවඳකින් යුක්තයි. සාමාන්‍ය අස්වැන්න වශයෙන් හෙක්ටයාරයට මෙට්‍රික් ටොන් 4.8 ක් ලබාගත හැකිය. සුදු සහලකි.

### Bg 455



බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් ප්‍රථම වරට නිර්දේශ කරන ලද ගංවතුර තත්ත්වයන්ට ඔරොත්තු දෙන වී ප්‍රභේදයයි. සාමාන්‍ය අස්වැන්න ලෙස හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 6 ක් ලබාගත හැකි මාස 4 $^{1}/_{2}$ ක රතු නාඩු වී ප්‍රභේදයකි.

## ලොකු ලූනු

### MIBO - 01



මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් නිර්දේශ කරන ලද දින 75 - 80 කින් අස්වනු නෙලා ගත හැකි ලොකු ලූනු ප්‍රභේදයකි. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 37 කි. බල්බ බෙදීම සිදු නොවේ. කුඩිත්තාගේ හානියට ඔරොත්තු දෙයි. ගබඩා කිරීමේදී බර අඩුවීමේ ප්‍රමාණය අඩුය.

# රන් අස්වනු

## මිරිස්

### MIPC - 1

මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් නැගෙනහිර පළාතේ වගාව සඳහා නිර්දේශ කරන ලද මිරිස් ප්‍රභේදයකි. කෙටි මහත කරලින් යුක්තයි. කරලක දිග සෙන්ටිමීටර් 4.5 - 5 පමණ වන අතර පළල සෙන්ටිමීටර් 1.8 - 2.2 වේ. රෝග හා පළිබෝධ හානි වලට ඔරොත්තු දෙන, දිගු ගබඩා කාලයක් සහිත තද සැරකින් යුක්ත මිරිස් ප්‍රභේදයකි. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 15 කි.



## කව්පි

### ANKCP - 01

අඟුණකොලපැලැස්ස මාශ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් හඳුන්වාදුන් ප්‍රථම කව්පි ප්‍රභේදය වේ. දින 60 - 66 කදී අස්වනු නෙළාගත හැකි අතර සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1450 - 1500 කි. බීජ ලා දුඹුරු පැහැති වන අතර අස්වැන්නෙන් 75% ක් පළමු අස්වනු වාරය තුල නෙළාගත හැකිය. තෙවන කන්නයේ වගාව සඳහා සුදුසුය. බීජ වල පැහැයත් බීජ ප්‍රමාණයෙන් සාපේක්ෂව විශාල වීමත් නිසා පාරිභෝගික රුචිකත්වය වැඩිය.



# කොල්ලු

**01. අඟුණ කලු කොල්ලු**

**02. අඟුණ දුඹුරු කොල්ලු**

මීට පෙර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කොල්ලු ප්‍රභේද නිර්දේශ කිරීමක් සිදුකර නොතිබුණු අතර ගොවි ක්ෂේත්‍ර වලින් සහ පැළෑටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයෙන් ලබාගත් නියැදි පරීක්ෂාවන්ට ලක් කර අඟුණකොලපැලැස්ස මාශ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් කලු පැහැයෙන් හා දුඹුරු පැහැයෙන් යුතු මෙම නව කොල්ලු ප්‍රභේද දෙක හඳුන්වා දී ඇත. අස්වනු නෙළීමට ගත වන කාලය අඟුණ කලු කොල්ලු ප්‍රභේදය සඳහා දින 85 - 95 ක් වන අතර, අඟුණ දුඹුරු කොල්ලු ප්‍රභේදය සඳහා දින 95 - 100 වේ. සාමාන්‍ය අස්වැන්න ලෙස අඟුණ කලු කොල්ලු ප්‍රභේදයෙන් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 900 ක්ද, අඟුණ දුඹුරු කොල්ලු ප්‍රභේදයෙන් හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 800 ක්ද ලබා ගත හැකිය.



අඟුණ කලු කොල්ලු



අඟුණ දුඹුරු කොල්ලු

# පැපොල්


**හොරණ පැපොල් දෙමුහුම් - 01**



කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රථම වරට නිර්දේශ කරනු ලැබූ දෙමුහුම් පැපොල් ප්‍රභේදයයි. හොරණ පළතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ සිදු කරන ලද පර්යේෂණ වල ප්‍රතිඵලයක් ලෙස මෙම නව දෙමුහුම් පැපොල් ප්‍රභේදය 2014 වර්ෂයේදී වගාව සඳහා නිර්දේශ කරන ලදී. රෙඩ් ලේඩි ප්‍රභේදයට වඩා රසයෙන්

# රන් අස්වනු

වැඩියි. මදය දීප්තිමත් තද රතු පැහැයකින් යුක්තයි. පැපොල් මුදු පුල්ලි වෛරස් රෝගයට ඔරොත්තුදීමේ හැකියාවක් ඇත. වසර පුරාම ඵල දරණ අතර පළමු වසරේදී එක් ගසකින් කිලෝග්‍රෑම් 75 ක සාමාන්‍ය අස්වැන්නක්ද, දෙවන වසරේදී කිලෝග්‍රෑම් 45 ක සාමාන්‍ය අස්වැන්නක්ද ලබා ගත හැකිය.



## බතල




### HORDI - මාලි

ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් නිර්දේශ කරන ලද මාස 3 කින් අස්වනු නෙලා ගත හැකි බතල ප්‍රභේදයකි. පැණිරස ඉතා අඩුය. අල ගුල්ලාගේ හානියට පාත්‍ර වීම ද අඩුයි. සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 24 කි.

## ලාවුලු

හොරණ ලාවුලු 01
හොරණ ලාවුලු 02
හොරණ ලාවුලු 03

හොරණ පලතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් ගෙඩියේ විවිධ හැඩැති ලාවුලු වර්ග 3 ක් නිර්දේශ කරන ලදී. හොරණ ලාවුලු




හොරණ ලාවුලු 01

01 ප්‍රභේදයෙන් වසරකට එක් ගසකින් ගෙඩි 40 - 50 ක් ද, හොරණ ලාවුලු 02 ප්‍රභේදයේ ගසකින් ගෙඩි 120 - 250 ක් ද, හොරණ ලාවුලු 03 ප්‍රභේදයෙන් ගෙඩි 150 - 250 ක් ද, අස්වනු වශයෙන් නෙළාගත හැකිය. වසර පුරාම ඵල දරණ අතර මල් පිපීමෙන් මාස 5 - 6 කට පසුව අස්වනු නෙළාගත හැකිය. ගෙඩියක බර, හොරණ ලාවුලු 01 ප්‍රභේදයේ ග්‍රෑම් 450 ක්ද හොරණ ලාවුලු 02 ප්‍රභේදයේ ග්‍රෑම් 265 ක්ද හොරණ ලාවුලු 03 ප්‍රභේදයේ ග්‍රෑම් 190 ක්ද වේ.



හොරණ ලාවුලු 02



හොරණ ලාවුලු 03

## චෙම්පඩක්

### හොරණ චෙම්පඩක්

හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් හඳුන්වා දෙනු ලැබූ නව පලතුරු වර්ගයකි. ගස සහ ගෙඩි රූපාකාරයෙන් කොස් වලට සමාන වේ. මදුලු ඉතා තද පැණි රසකින් යුක්තයි. ගෙඩියක බර කිලෝග්‍රෑම් 5 ක් පමණ වේ. වසරේ නොවැම්බර් - මාර්තු මාස වලදී මල් පිපෙන අතර ජනවාරි - ජූනි අතර කාලයේදී ඵල දැරීම සිදුවේ. පළමු වසරේදී එක් ගසකින් ගෙඩි 66 ක් පමණද, තුන්වන වසර වන විට ගෙඩි 79 ක් පමණද අස්වනු වශයෙන් ලබා ගත හැකිය.



